**PAUL RATNAYEKE ASSOCIATES**
ATTORNEYS-AT-LAW
COLOMBO

109

# කොළඹ දිසා අධිකරණයේදීය.

නිහාල් ශ්‍රී අමරසේකර,
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

**පැමිණිලිකරු**

නඩු අංකය:19849/එම්ආර්.

\- එදිරිව -

17-3-1998
කොළඹ 12

ගාමිණී ලක්ෂ්මන් පීරිස්
"රිසුම්පාය", ස්ටේපල්ස් වීදිය,
කොළඹ 02 සහ
37, කිරුළ පෙදෙස,
කොළඹ 05.

**විත්තිකරු**

වර්ෂ 1998 ක්වූ මාර්තු මස 17 වන මෙදිනදීය.

ඉහත අංක දරණ නඩුවේ විරෝධතා ප්‍රකාශය සමඟ විත්තිකරුගේ දිවුරුම් ප්‍රකාශය මේ සමඟ ඉදිරිපත් කරන අතර එය භාරගෙන නඩු වාර්තාවේ ගොනු කරන ලෙසත්, විරෝධතා ප්‍රකාශයේ අයැද ඇති සහනයන් ලබාදෙන ලෙසත් ගරු අධිකරණයෙන් ගෞරවයෙන් අයැද සිටිමු.

**විත්තිකරුගේ ලේඛණගත නීතිඥවරු.**

මෙහි පිටපතක් පැමිණිලිකරුගේ ලේඛණගත
නීතිඥතැන වෙත ලියාපදිංචි තැපෑලෙන් යවා
ඒ බව සනාථ කරන ලියාපදිංචි තැපැල් භාණ්ඩ
කුවිතාන්සිය මීට අමුණා ඇත.

**විත්තිකරුගේ ලේඛණගත නීතිඥවරු.**

PAUL RATNAYEKE ASSOCIATES
ATTORNEYS-AT-LAW
COLOMBO

**කොළඹ දිසා අධිකරණයේ දී ය.**

නිහාල් ශ්‍රී අමරසේකර
167/4, ශ්‍රී විපුලසේන මාවත
කොළඹ 10.

පැමිණිලිකරු.

නඩු අංකය: 19849/එම්ආර්

- එදිරිව -

ගාමිණී ලක්ෂ්මන් පීරිස්
'විසුම්පාය', ස්ටෙප්ල්ස් වීදිය
කොළඹ 2 සහ
37, කිරුළ පෙදෙස
කොළඹ 5.

විත්තිකරු.

මුද්දර ගාස්තු
විනාසි අංකය } 19134
දිනය
ප්‍රකරණක් මුදල
කාරණය
දිසා අධිකරණය කොළඹ
98/3/17
19 ...... දින

17-3-1998

1998 මාර්තු මස 17 වන දින දී ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයින් වන 'පෝල් රත්නායක ඇසෝසියේට්ස්' නම් නාමධාරී විලාශයෙන් හවුල් ව්‍යාපාර කටයුතු කරන ජේම්ස් හෙන්රි පෝල් රත්නායක සහ උස්වත්ත ලියනගේ සුදත් තිලුපුල් ප්‍රසංග පෙරේරා සහ ඔවුන්ගේ සහායකයන් වන ප්‍රත්‍යක්ෂාන්ති නවරත්න මෙනෙවිය, ශල්න්ද්‍රි රයස්හ මිය, ඉන්ද්‍රලෝජනී රාජගෝපාලන් මෙනෙවිය, චන්ද්‍රානි සූරියආරච්චි මෙනෙවිය, කෝලිත සුසන්ත බණ්ඩාර විජේරත්න මහතා, අමාලි අලව්ව මෙනෙවිය, රුචිරා ඇත්තනී මෙනෙවිය සහ ප්‍රසන්න ද සිල්වා මහතා යන නීතිඥවරුන් මඟින් පෙනී සිටින ඉහත නම සඳහන් විත්තිකරුගේ විරෝධතා ප්‍රකාශයෙන් මෙසේ ප්‍රකාශ කර සිටියි:-

01. ලේඛන අනාවරණය කිරීම සඳහා නියම කරන දැන්වීම නොපැහිදිලි සහ/හෝ පුළුල් විෂය පථයකින් යුක්ත බව විත්තිකරු ප්‍රකාශ කරයි.

02. වෙනත් හේතු අතර පැමිණිල්ලෙන් මේ විත්තිකරුට විරුද්ධව නඩු නිමිත්තක් අනාවරණය නොවන නිසා මේ නඩුවේ කිසිම ප්‍රශ්නගත කාරණයකට අදාළව විත්තිකරුගේ සන්තකයේ සහ/හෝ බලය යටතේ ලේඛන කිසිවක් නැති බව විත්තිකරු ප්‍රකාශ කරයි.

03. 1998 මාර්තු මස 10 වන දිනැති උද්දේශිත දැන්වීම ප්‍රමාද දෝෂයකින් කර ඇති බව සහ/හෝ එහි සඳහන් කරන ලද යම් ආඥාවක් ප්‍රමාද දෝෂයකින් කරන ලද්දක් බව විත්තිකරු වැඩිදුරටත් ප්‍රකාශ කරයි.

04. කෙසේ වුව ද එමෙන්ම ඉහත ක කරුණුවලට හානියක් නොමැතිව ද විත්තිකරු ප්‍රකාශ කරන්නේ දැන්වීමේ සඳහන් ලේඛන ඔහුගේ පෞද්ගලික තත්ත්වයෙන් ඔහුගේ සන්තකයේ නැති ලේඛන බවත් -

**PAUL RATNAYEKE ASSOCIATES**
ATTORNEYS-AT-LAW
COLOMBO



(අ) ඒවා අනාවරණය කිරීම සඳහා මේ නඩුවේ දී ආඥාවක් කළ නොහැකි බවත්;

(ආ) කෙසේ වුව ද ඒවා වරප්‍රසාද ලත් ලේඛන බවත් ය.

05. කෙසේ වුව ද එමෙන්ම ඉහත කී කරුණු වලට හානියක් නොමැතිව ද පැමිණිලිකරු දැන්වීමේ මුහුණත අනුව එහි දක්වා ඇති පරිදි ලේඛන අනාවරණය කිරීමට හිමිකම් නොලබයි.

06. කෙසේ වුව ද දැන්වීමේ දක්වා ඇති පරිදි අනාවරණය කිරීමේ ආඥාවක් නීතියට අනුව කළ නොහැකි ය.

එමනිසා විත්තිකරු අයැද සිටින්නේ :-

(අ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102 වන වගන්තිය යටතේ පැමිණිලිකරු විසින් කර ඇති උද්දේශිත ඉල්ලීම නිෂ්ප්‍රභ කරන ලෙස සහ/හෝ එට ඉඩ නොදෙන ලෙස;

(ආ) නඩු ගාස්තු ප්‍රදානය කරන ලෙස; සහ

(ඇ) සුදුසුයැයි ඔබතුමාගේ ගරු අධිකරණයට පෙනී යන වෙනත් හා වැඩිදුර සහන ප්‍රදානය කරන ලෙස ය.

විත්තිකරුගේ ලියාපදිංචි නීතිඥවරු.

<u>සකස් කළේ</u>

නීතිඥ හර්ෂ අමරසේකර මහතා
ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා

## කොළඹ දිසා අධිකරණයේ දී ය.

නිහාල් ශ්‍රී අමරසේකර
167/4, ශ්‍රී විපුලසේන මාවත
කොළඹ 10.

පැමිණිලිකරු.

නඩු අංකය: 19849/එම්ආර් - එදිරිව -

ගාමිණි ලක්ෂ්මන් පීරිස්
'විසුම්පාය', ස්ටෙප්ල්ස් වීදිය
කොළඹ 2 සහ
37, කිරුළ පෙදෙස
කොළඹ 5.

විත්තිකරු.

කොළඹ 2, ස්ටෙප්ල්ස් වීදිය, 'විසුම්පාය' හි සහ කොළඹ 5, කිරුළ පෙදෙසේ අංක 37 හි ගාමිණි ලක්ෂ්මන් පීරිස් වන මම බෞද්ධාගමිකාරයකු වශයෙන් මෙහි පහත දැක්වෙන කාරණා ගම්භිරතා පූර්වකවත්, අවංකවත්, සත්‍ය ලෙසත් සහතික කොට ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමි.

01. මම මෙහි ඉහත නම සඳහන් සහතික ප්‍රකාශක සහ මේ නඩුවේ විත්තිකරු වෙමි.

02. ලේඛන අනාවරණය කිරීම සඳහා නියම කරන දැන්වීම නොපැහැදිලි සහ/හෝ පුළුල් විෂය පථයකින් යුක්ත බව මම ප්‍රකාශ කර සිටිමි.

03. වෙනත් හේතු අතර පැමිණිල්ලෙන් මට විරුද්ධව නඩු නිමිත්තක් අනාවරණය නොවන නිසා මේ නඩුවේ කිසිම ප්‍රශ්නගත කාරණයකට අදාළව මගේ සන්තකයේ සහ/හෝ බලය යටතේ ලේඛන කිසිවක් නැති බවට ප්‍රකාශ කිරීම සඳහා මට උපදෙස් ලැබී ඇති බව මම කියා සිටිමි.

04. 1998 මාර්තු මස 10 වන දිනැති උද්දේශිත දැන්වීම ප්‍රමාද දෝෂයකින් කර ඇති බව සහ/හෝ එහි සඳහන් කරන ලද යම් ආඥාවක් ප්‍රමාද දෝෂයකින් කරන ලද්දක් බව ප්‍රකාශ කිරීමට මට වැඩිදුරටත් උපදෙස් ලැබී ඇත.

05. කෙසේ වුව ද එමෙන්ම ඉහත කී කරුණුවලට හානියක් නොමැතිව ද මම ප්‍රකාශ කරන්නේ දැන්වීමේ සඳහන් ලේඛන මගේ පෞද්ගලික තත්ත්වයෙන් මගේ සන්තකයේ නැති ලේඛන බව ප්‍රකාශ කිරීමට මට උපදෙස් ලැබී ඇති බවයි -

( අ ) ඒවා අනාවරණය කිරීම සඳහා මේ නඩුවේ දී ආඥාවක් කළ නොහැකි බවත්;

( ආ ) කෙසේ වුව ද ඒවා වරප්‍රසාද ලත් ලේඛන බවත් ය.

06. කෙසේ වුව ද එමෙන්ම ඉහත කී කරුණුවලට හානියක් නොමැතිව ද පැමිණිලිකරු දැන්වීමේ මුහුණත අනුව එහි දක්වා ඇති පරිදි ලේඛන අනාවරණය කිරීමට හිමිකම නොලබන බවට මට උපදෙස් ලැබී ඇත.

07. කෙසේ වුව ද දැන්වීමේ දක්වා ඇති පරිදි අනාවරණය කිරීමේ ආඥාවක් නීතියට අනුව කළ නොහැකි බවට ද මට උපදෙස් ලැබී ඇති බව මම ප්‍රකාශ කර සිටිමි.




කියවා තේරුම් ගෙන ප්‍රතිඥා දී
වර්ෂ 1998 ක් වූ මාර්තු මස
17 වන දින කොළඹ දී
අත්සන් කරන ලදී.

මා ඉදිරිපිට දී ය.

සාමදාන විනිශ්චයකාර.

S. M. K. GUNASEKARA
Justice of the Peace (All Island)
No: 36/43, Araliya Uyana,
Polwatta, Pannipitiya.